සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## පෙරදිග සංගීතය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. "ඇහැල මහට ඇහැල ගහක" යන රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතය අයත් රාගය වන්නේ,
   i බිලාවල් රාගය   ii කාෆි රාගය   iii භූපාලි රාගය   iv යමන් රාගය

2. කාෆි රාගයේ යෙදෙන කෝමල ස්වර ගණන
   i එකකි   ii දෙකකි   iii තුනකි   iv හතරකි

3. මාත්‍රා 10 කින් යුත් හින්දුස්ථානී තාලය නම් කරන්න.
   i කෙහෙර්වා තාලය   ii දීප්චන්දි තාලය   iii ඣප් තාලය   iv ත්‍රිතාලය

4. තබ්ලා පද අත්ලෙන් යොදා නිරූපණය කිරීමේ දී, අත්පුඩි නොගසා අත ඉවතට යොදනු ලබන තාල සංකේතය කුමක්ද?
   i x   ii 2   iii 3   iv 0

5. ස්වර ස්ථාන පිහිටීම එකිනෙකට සමාන වන භාණ්ඩ යුගලයකි.
   i වයලීනය, එස්රාජය   ii සිතාරය, එස්රාජය   iii සිතාරය, ගිටාරය   iv වයලීනය, සිතාරය

6. නූර්ති රංග සම්ප්‍රදායේදී යොදාගනු ලබන ස්වර වාද්‍ය භාණ්ඩයක් හා තාල වාද්‍ය භාණ්ඩයක් වන්නේ,
   i සර්පිනාව, උඩැක්කිය   ii සර්පිනාව, තබ්ලාව   iii වයලීනය, තම්මැට්ටම   iv බටනලාව, මද්දලය

7. ගැමි ගී වල එන, මෙහෙ ගී ගණයට අයත් ගීත යුගලයකි
   i නෙළුම් ගී, ගොයම් ගී   ii ගොයම් ගී, නූර්ති ගී
   iii තුන්සරණේ ගී, කමත් ගී   iv කෙළි ගී, ගොයම් ගී

8. නාඩගම් සම්ප්‍රදායේ භාවිතාවන තාල වාද්‍ය භාණ්ඩය වන්නේ,
   i තබ්ලාව   ii මෘදංගය   iii මද්දලය   iv ඩෝල්කිය

9. ඉන්දියාවේ බෙංගාල ප්‍රදේශයේ ප්‍රචලිත වූ ගී විශේෂයකි
   i වංග ගී   ii දමිළ ගී   iii නූර්ති ගී   iv නාඩගම් ගී

10. "කොබෝ කුරුළුවනේ" මෙම ගී පාදයේ සඳැස්මත් හා ගීමත් ගණන පිළිවෙලින් ඇතුළත් පිළිතුර තෝරන්න.

i 12 හා 09   ii 09 හා 12

iii 08 හා 12   iv 12 හා 08

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**
**(පිතු සෙනෙහේ පිදූ, දූණුකෙයියා මලක් වගේ, රෝජා, වංග, කමත් ගී, භජන් ගී)**

11. "චින්න චින ආසෙ, සිරහඩික්කුම් ආසෙ" යන දමිළ ගීතය ඇතුළත් චිත්‍රපටය වන්නේ .................... ය

12. හින්දුස්ථානී සංගීතයේ දෙවියන් උදෙසා ගැයූ ගී විශේෂයකි .......................................

13. බැත, කුල්ල, අම්බරුවන් වැනි සුවිශේෂී වචන භාවිතාවන මෙහෙ ගී විශේෂයකි .......................................

14. ................................ යන ගීතය පිය ගුණ වැණුම් ගීතයකි

15. "නම්රේ කිසී බොලෝ රධා" යන ගීතය ........................................... ගීයකි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.**

16. සිතාරය වාදනය කරනුයේ පික් (Pick) එකෙනි. ( )
17. බටහිර සංගීත ප්‍රස්ථාරකරණ රේඛා මණ්ඩලය ස්ටේව් (Stave) ලෙස හඳුන්වයි. ( )
18. /දොං/පිංත/ගත/දොංත/ යන උඩරට බෙරපදය මැදුම් තනි තිතට අයත් වේ. ( )
19. මිණිම් (𝅗𝅥) සංකේතයේ වටිනාකම මාත්‍රා 04 කි. ( )
20. "දෙවන් පහන් මිනි නගා" යන ගීතය කිතුණු බැති ගීයකි ( )

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.**

1. i කාෆි හෝ භූපාලි රාගවලින් එකකට අයත්, රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්ථාර කර දක්වන්න. (ල 6)

ii එම රාග දෙකෙහිම ආරෝහණ හා අවරෝහණ ස්වර ලියා දක්වන්න (ල 4)

2. i මාත්‍රා 08 කින් හා මාත්‍රා 14 කින් යුත් හින්දුස්ථානී තාල 02 පිළිවෙළින් නම් කරන්න. (ල 2)

ii ඉන් එක් තාලයක් නියමිත තාල සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න. (ල 4)

iii ඉහත තාල දෙකට අයත් දේශීය තිත් දෙක නම් කර, ඉන් එකකට අයත් බෙර පදයක් නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න. (ල 4)

3. i සඳැස්මත් හා ගීමත් යන්න පැහැදිලි කරන්න. (ල 4)

ii ''මළිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ'' යන ගී පාදය, ගැයීමට සුදුසු තාලය අනුව පද ප්‍රස්ථාර කරන්න. (ල 4)

iii ඉහත ගී පාදයේ සඳැස්මත් හා ගීමත් ගණන වෙන වෙනම ලියා දක්වන්න. (ල 2)

4. i සරල ගීතයක ආකෘතියට අයත් කොටස් නම් කරන්න. (ල 4)

ii ගැමි ගී වල ලක්ෂණ 03ක් ලියන්න. (ල 3)

iii කමත් ගීයක් හෝ ගොයම් ගීයක් ලියා දක්වන්න. (ල 3)

5. i රේඛා මණ්ඩලයක් ඇඳ, එහි C D E F G A B යන ස්වර පිහිටන ස්ථාන ක්‍රොචට් (crotchet) සංකේතයෙන් සලකුණු කරන්න. (ල 6)

ii පහත දැක්වෙන බටහිර සංගීතයේ භාවිතා වන සංකේත නම් කරන්න.

(a) 𝄞 -   (b) O -

(c) 𝄢 -   (d) 𝅗𝅥 - (ල 4)

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 08 - 2023**

## පෙරදිග සංගීතය - (ප්‍රායෝගික පරීක්ෂණය)

01. ඔබ කැමති රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක් ගායනා කරන්න. (ල 10)

02. නූර්ති/ නාඩගම්/ නව නාට්‍ය ගී වලින් එක් ගීතයක් ගායනා කරන්න. (ල 10)

03. i නෙළුම් ගී/ කමත් ගී/ ගොයම් ගීත වලින් එක් ගීතයක් ගායනා කරන්න. (ල 05)

    ii ගුරුභවතා විසින් නම් කරන ලද තාලයක් අතින් තාල යොදා පෙන්වන්න. (ල 05)

04. භජන්/වංග/දමිල/මච්පිය ගුණ ගීත වලින් එක් ගීතයක් ගායනා කරන්න. (ල 10)

05. i ස්වර පුවරුවෙන් ඔබ කැමති ගීතයක් වාදනය කරන්න. (ල 05)

    ii ඔබ විසින් තෝරාගත් ස්වර වාද්‍ය භාණ්ඩයකින් ස්වර ස්ථාපන ගීතයක් හෝ ස්වර සප්තකය වාදනය කරන්න. (ල 05)

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 08 - 2023

# පෙරදිග සංගීතය - පිළිතුරු

## I කොටස

| | | | |
|---|---|---|---|
| 1. 3 | 6. 2 | 11. රෝජා | 16. x |
| 2. 2 | 7. 1 | 12. භජන් | 17. √ |
| 3. 2 | 8. 3 | 13. කමත් ගී | 18. x |
| 4. 4 | 9. 1 | 14. පිතුසෙනෙහේ පිදු | 19. x |
| 5. 3 | 10. 2 | 15. වංග ගී | 20. √ |

## II කොටස

01. i ස්වර හා ගීතය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල 6)
ii ආරෝහණ, අවරෝහණ ස්වර නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න (ල 4)

02. i කෙහෙර්වා/ ලාවනි
දීප්චන්දි (ල 2)
ii නියමිත තාල සංඥා සහිතව ප්‍රස්ථාර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල 4)
iii මහතනිතිත / සුළු තනිතිත
මැදුම් මහ දෙතිත නම් කර, අදාළ බෙර පදය ප්‍රස්ථාර කර ඇත්නම් (ල 4)

03. i සදැස්මත් හා ගී මත් යන්න පැහැදිලි කර ඇත්නම් (ල 4)
ii මාත්‍රා තුනෙන් තුනට ප්‍රස්ථාර කර ඇත්නම් (ල 4)
iii සදැස්මත් 16 ගීමත් 24 කි. (ල 2)

04. i පෙරවාදනය - Introduction
ස්ථායි කොටස (මුල් කොටස) - Song/Chorus
අතුරු වාදනය - Interlude
අන්තරා කොටස - Verse
ලෙස ඇත්නම් ලකුණු ලබා දෙන්න (ල 4)
ii ගැමි ගී වල ලක්ෂණ 3 ක් ලියා ඇත්නම් (ල 3)
iii ගොයම් ගීයක් හෝ කමත් ගීයක් ලියා ඇත්නම් (ල 3)

5. i රේඛා මණ්ඩලය ඇද ඇත්නම් ලකුණු 2ක් ද, ක්‍රොචට් (crotchet) වලින් ස්වර ලකුණු කර ඇත්නම් ලකුණු 4 ක් ද ලබා දෙන්න. (ල 6)
ii (a) Trable clef (b) Semi brave
(c) Bass clef (d) Minim (ල 4)